සුළු හා සූක්ෂ්ම කර්මාන්ත ප්‍රමුඛ හා ව්‍යවසාය ප්‍රවර්ධන III ව්‍යාපෘතියේ ( එස්එම්අයිඑල්ඊ - III) චක්‍රීය අරමුදල - 2013

---

සුළු හා සූක්ෂ්ම කර්මාන්ත ප්‍රමුඛ හා ව්‍යවසාය ප්‍රවර්ධන III ව්‍යාපෘතියේ ( එස්එම්අයිඑල්ඊ - III) චක්‍රීය අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ( ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජපන් බැංකුව (ජාසජබැ) අතර හා (එලඕ අංක එස්එල්පී 81) 2004 දෙසැම්බර් 07 දිනැති ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 3 (8) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

සුළු හා සූක්ෂ්ම කර්මාන්ත ප්‍රමුඛ හා ව්‍යවසාය ප්‍රවර්ධන III චක්‍රීය අරමුදලේ මෙහෙයුම් උපදෙස් අනුව, කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම චක්රීය අරමුදලේ අරමුණු වන්නේ සුළු හා සූක්ෂම කර්මාන්ත වලට ප්‍රාග්ධනය සැපයීම මඟින් ශ්‍රී ලංකාවේ ස්ථාවර හා සමබර ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම, සුළු හා සූක්ෂම කර්මාන්තයන්හි කළමනාකරණය, ගිණුම්කරණ හා කාර්මික දක්ෂතා සංවර්ධනය කිරීම සහ අතරමැදි මූල්‍ය ආයතනන්හි ආයතනික හැකියාව සවිමත් කිරීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපාන යෙන් මිලියන 9,619 ක් වූ අතර මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ ජපන් බැංකුව එකඟවී තිබුණි. ණය ගිවිසුමේ 03 (6) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ සමහර ණය දෙන ආයතන වලට නැවත ණය දීම සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමට බලය දී ඇත. නැවත ණය දීමේ ක්‍රියාවලිය මඟින් අරමුදලේ වර්ධනය ප්‍රධාන ණය නැවත ගෙවීමට භාවිතා කෙරෙනු ඇත. මෙහෙයුම් උපදෙස් අනුව, පු.සු.සූ.ක.ත.- III චක්‍රීය අරමුදල එහි කටයුතු 2012 මැයි 01 දින ආරම්භ කර ඇත.

**1**.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා

විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල චක්‍රීය අරමුදලේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ චක්‍රීය අරමුදලේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) චක්‍රීය අරමුදලේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් චක්‍රීය අරමුදලේ ප්‍රගතිය, චක්‍රීය අරමුදලේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) චක්‍රීය අරමුදල යටතේ සපයන ලද අරමුදල් නිශ්චිත අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඈ) චක්‍රීය අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3.** **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා චක්‍රීය අරමුදල නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ චක්‍රීය අරමුදලේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**4.1** **මූල්‍ය කාර්යසාධනය**

-----------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා චක්‍රීය අරමුදලේ මුළු වියපැහැදම රු. 184,146,720 කි. සමාලෝචිත වර්ෂයේ චක්‍රීය අරමුදල් මෙහෙයුම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ණය සහභාගීත්ව ආයතන (PCIS) | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රතිපූර්ණය කළ වටිනාකම |
| --- | --- |
| | රු. |
| කොමර්ෂල් බැංකුව (CB) | 8,000,000 |
| ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව (DFCC) | 34,080,000 |
| ජාතික සංවර්ධන බැංකුව (NDB) | 14,400,000 |
| සම්පත් බැංකුව (SB) | 13,840,000 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) | 5,160,000 |
| හැටන් නැෂනල් බැංකුව (HNB) | 68,315,200 |
| සෙලාන් බැංකුව | 37,951,520 |
| මහජන බැංකුව | 2,400,000 |
| ලංකා බැංකුව | - |
| **එකතුව** | **184,146,720** |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

අ) 2012 දී නිම කරන ලද එස්.එම්.අයි.එල්.ඊ. – III ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද පරිපාලන හා අනෙකුත් පිරිවැය එකතුව රු.4,053,037 ක් චක්‍රීය අරමුදලට මාරුකර එහි පිරිවැයක් ලෙස දක්වා තිබුණි.

ආ) මහජන බැංකුව විසින් 2013 නොවැම්බර් 04 දින ලබාදෙන ලද අතුරු ණය වෙනුවෙන් ලැබිය යුතු පොලී වටිනාකම රු. 129,300 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ එස්.එම්.අයි.එල්.ඊ. – III ව්‍යාපෘතියේ ඉදිරියට ගෙන ආ ශේෂය වූ රු. 8,902,326,944 ක් චක්‍රීය අරමුදල විසින් භාවිතා කර තිබුණු නමුත් ඒ පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

--------------------------------------

## 6.1 අරමුදල් උපයෝජනය

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම වාර්තාවේ 4.1 ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ණය සහභාගීත්ව ආයතන 8 ක් විසින් ලබා දී ඇති රු. 184,146,720 ක මුළු ණය එකතුවෙන් රු. 140,346,720 ක උප ණය වටිනාකමක් ණය සහභාගීත්ව ආයතන 3 ක් විසින් ලබා දී තිබුණි. එසේම, ලංකා බැංකුව මෙම චක්‍රිය අරමුදල් පහසුකම යටතේ කිසිදු උප ණයක් ලබාදී නොතිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද රු. 300,000,000 ක මුළු ප්‍රතිපාදනයෙන්, සමාලෝචිත වර්ෂය තුළදී රු.186,554,529 ක් පමණක් උප ණය ලබාදීමට හා පරිපාලන කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

(ඇ) චක්‍රීය අරමුදල් කළමනාකරණ ඒකකය 2012 මැයි මාසයේදී ස්ථාපිත කර තිබුණු නමුත් උප ණය වියපැහැදම් කිරීම ආරම්භ කර තිබුණේ 2013 නොවැම්බර් මාසයේදීය.

(ඈ) මෙහෙයුම් උපදෙස් අනුව, තාක්ෂණික සහය හා පොදු අරමුණු යනුවෙන් නම් කළ අරමුණු දෙකක් සඳහා උප ණය ලබා දීම අපේක්ෂා කළද, සමාලෝචිත වර්ෂය තුළදී තාක්ෂණික සහය වෙනුවෙන් කිසිදු උප ණයක් ලබා දී නොතිබුණි.

පොදු අරමුණු වෙනුවෙන් ලබා දී තිබුණු උප ණය සඳහා පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

I. ප්ලාස්ටික්, හම්, කඩදාසි නිෂ්පාදිත ආදී නිෂ්පාදනයන් කරන කර්මාන්තයන් සඳහා එක් උප ණයක් බැගින් පමණක් ලබා දී තිබුණු අතර පොදු අරමුණු යටතේ උප ණය ලබා දීම සඳහා තෝරාගෙන තිබූ අංශයක් වන රසායනික නිෂ්පාදන අරමුණ යටතේ කිසිදු උප ණයක් ලබා දී නොතිබුණි.

II. 2013 වර්ෂය තුළදි වියපැහැදම් කළ මුළු ණය අතුරින්, රු. මිලියන 105.72 ක් එනම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 57 ක් ආහාර පිරිසැකසුම, පානීය වර්ග හා දුම්කොල නිෂ්පාදිත, වානේ නිෂ්පාදිත හා ධීවර ආදී ක්ෂේත්‍ර 3ක් සඳහා පමණක් ලබා දී තිබුණු අතර ඉතිරි රු.මිලියන 75.23 ක් අනෙකුත් ක්ෂේත්‍ර 11ක් වෙනුවෙන් වියපැහැදම් කර තිබීම මගින් ඒ ඒ අංශ සඳහා ණය බෙදීයාමේ අසමානතාවයක් පිළිඹිබු විය.

III. චක්‍රීය අරමුදලේ මෙහෙයුම් උපදෙස් අනුව, ධීවර, කෘෂිකර්ම හා සත්ව පාලන අංශ සඳහා උප ණය ලබා දීමට වැඩි අවධානයක් යොමු කළ යුතුය. කෙසේ වෙතත් ණය සහභාගීත්ව ආයතන එවැනි අංශ සඳහා උප ණය 3 ක් රු.මිලියන 5.59 ක් වටිනාකමකට එනම්, ලබා දී ඇති මුළු ණය වටිනාකමින් සියයට 3 ක් පමණක් ලබා දී තිබුණි.

IV. එසේම, පොදු අරමුණු සඳහා වියපැහැදම් කරන ලද උප ණය එකතුවෙන්, රු. 68,626,720 ක් එනම් සියයට 37 ක් බස්නාහිර පළාතේ පිහිටා ඇති ව්‍යාපාර වෙත 2013 දෙසැම්බර් 31 දිනට ලබා දී තිබුණි. මෙහෙයුම් උපදෙස් අනුව, ග්‍රාමීය ප්‍රදේශ වල උප ණය වියපැහැදම් සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී ඉලක්ක ගත ප්‍රදේශ වන මාතලේ, නුවරඑළිය, මොනරාගල, ත්‍රිකුණාමලය, වව්නියාව, යාපනය, කිළිනොච්චිය, මන්නාරම ආදී ප්‍රදේශ වල ඇති ව්‍යාපාර වෙත කිසිදු උප ණයක් වියපැහැදම් කර නොතිබුණි.

**7.** **පද්ධති හා පාලන**

**--------------------**

පහත පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අරමුදල් වියපැහැදම
(ආ) මුදල් කළමනාකරණය